# නිපුණතාව 5.0

ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි
ඓතිහාසික හා සංස්කෘතික
පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය
රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 5.3 : ශ්‍රී ලාංකේය ගැමිනාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.

# ක්‍රියාකාරකම 5.3.1
# සොකරි ගැමි නාටකය පිළිබඳ තතු විමසා බලමු.

# ඉගෙනුම් පල 5.3.2

- සොකරි දේශීය ගැමි නාටකයක් බව ප්‍රකාශ කරයි.
- සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ හා පැවැත්වීමේ අරමුණු විස්තර කරයි.
- සොකරි කථා ප්‍රවෘත්තිය පවසයි.
- සොකරි ගැමි නාටකයෙහි ගායන වාදන හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ අදහස් දක්වයි.
- සොකරි ගැමි නාට්‍යයෙහි චරිත නිරූපණ පිළිබඳ විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.
- ගැමිනාටක අභාවයට යා නොදී ආරක්ෂා කරගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.

# සොකරි ගැමි නාටකය පිළිබඳ හඳුනා ගනිමු

# අපේ ගැමි නාටක

සොකරි (උඩරට නර්තන සම්ප්‍රදාය)

කෝලම් (පහත රට නර්තන සම්ප්‍රදාය)

රෑකඩ

නාඩගම්



. මෙම ගැමි නාටක

කථා පුවත්,

චරිත

වාද්‍ය භාණ්ඩ,

ගායන,

ඇඳුම් පැළඳුම්

ආදියෙන් එකිනෙකට වෙනස්කම් දක්වයි .

සොකරි ලක්දිව පවත්නා පැරණිතම ගැමි නාටක විශේෂයකි

සොකරි ලක්දිව පවත්නා පැරණිතම ගැමි නාටක විශේෂයකි


සොකරි උඩරට, වන්නි හා බදුල්ල ප්‍රදේශවල ප්‍රචලිත ව පවතී.

එහි දී ප්‍රධාන වශයෙන්

හඟුරන්කෙත,
මාතලේ,
කොටුවේගොඩ,
කොනකලගල,
පාතහේවාහැට,
උඩහේවාහැට,
කපුලියද්ද,
හපුගන්දෙණිය,
හේනවල,
ලග්ගල,
තලාතුඔය,
නිලදණ්ඩාහින්න,
බටුවත්ත,
බදුල්ලේ දික්පිටිය
දඹුල්ලේ කළුන්දෑව
උඩ පේරාදෙණිය

යන ගම් නියම්ගම් සඳහන් කළ හැකි ය.

සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් පූජාර්ථයෙන් කරනු ලබන අභිචාර ක්‍රමයක් ලෙසත් සිදු කරන නිසා මෙය ශාන්තිකර්ම විශේෂයක් බව ඇතැම් අයගේ පිළිගැනීම යි.



# සොකරි කතා පුවත

**කසී දේශයෙහි ගුරුහාමි නමින් යුත් ආඬිගුරෙක්**





රූමත් යුවතියක වූ ''සොකරි'' නම් කාන්තාවක සරණපාවා ගනී.



විවාහ වී බොහෝ කලක්
ගත වන තුරුත්
දරු සම්පතක් නොලැබූ
බැවින්



කතරගම දෙවියන්ට

බාරයක් ඔප්පු කිරීම
සඳහා

සඳහා ඔවුහු
ලක්දිවට
පැමිණෙති.






ඔවුන් සමග
මෙහෙකරුවා වන පරයා සහ
කාලි අම්මා ද ලක්දිවට
පැමිණෙති.



එහි දී පදිංචි වීමට ඉඩමක්
සොයන අතරතුරේ දී තඹරාවිට නම් ගමෙහි ඔවුහු
පදිංචි වෙති.



එක් දිනක් ගුරුහාමි වතුර ගෙන
ඒමට යෑමේ දී ගමේ වෙදරාලගේ
බල්ලා ඔහුගේ කකුල සපා කයි.







ඊට ප්‍රතිකාර කිරීම සඳහා
වෙදරාල පැමිණෙන්නේ
සොකරිය පිළිබඳ
ඇල්මකිනි.

ප්‍රතිකාර කිරීමෙන් පසු
මැදියම්
රැයේ දී වෙදරාල සොකරිය
සමඟ පලා යයි.





කතරගම දෙවියන්ට කරන කන්නලව්වකින්
පසුමග සලකුණු දැක වෙදරාලගේ
නිවසේ සිටි සොකරිය ගුරුහාමි විසින්
කැඳවාගෙන එනු ලබන්නී ය

කථාව අවසන් වන්නේ වෙදරාලට
දාව සොකරියට දරුවකු ලැබීමෙනි.
එහෙත්
අවසානයේ ගුරුහාමි සොකරි සමඟ
සාමදානයෙන් ජීවත් වෙයි.



සොකරි නාටකයේ කතා පුවත ප්‍රාදේශික වශයෙන් වෙනස්කම් සහිත ය.



සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු ලෙස සශ්‍රීකත්වය වර්ධනය කිරීම සහසමෘද්ධිය පැතීම දැක්විය හැකි ය.

එහි දී ස්ත්‍රියකට දරුවකු ලැබීම මගින් සශ්‍රීකත්වය නිරූපණය කෙරේ. නාට්‍ය අවසානයේ සොකරිය ලබන දරුවා සුරතල් කිරීම ද දරුවා ප්‍රේක්ෂකයන්ට පිළිගැන්වීම ද අවසානයේ කෙරෙන

**සෙත් පැතීම ද කෘෂිකාර්මික සමාජයේ සමෘද්ධිය සංකේතවත් කරයි**



තවත් අරමුණක් ලෙස පූජාර්ථයෙන්
ද, එනම් ත පත්තිනි දෙවියන්
ඇදහීමට ආරම්භ
වූ පූජෝත්සවයක් ලෙස ද මෙය
හැඳින්විය හැකි ය. ස්ත්‍රියක
පතිවත රැකීමේ අවශ්‍යතාවත්,
පතිවත රැකීම නිසා ඇය කෙරේ
ඇති වන බලයත්, මෙම නාටකය
තුළ දී විග්‍රහ කෙරේ



### මෙය සනාථ කරනු ලබන ගායනා ලෙස

හෙට්ටිරාල බැහැ දැක සැල කළ විට
නැටුම නියම වුණි ඒ සත් දෙන හට
සොකරි බාර වුණි පත්තිනි අම්මට
එදා තමයි මුල සොකරි නැටීමට

“ සොකරිය රැකදෙන් පත්තිනි අම්මා ”

**(තෑගි කවි)**

සත්පතිනි දෙවිඳුට බාර ය සොකරි එම විට

**(සොකරි කවි)**

සත්පතිනි දෙවිඳුට බාර ය සොකරි එම විට
(සොකරි කවි)



එසේ ම කතරගම දෙවියන් ඇදහීමට අවස්ථාවක් කොට
ගෙන ඇති බැවින් ද සොකරි
නාටකය පූජාර්ථය මුල් කර ගෙන පවත්වනු ලබන බව
පැහැදිලි වේ.



අතීතයේ ගොයම් කපා අස්වනු නෙළාගත් පසු
ව විවේක සුවයෙන් කල් ගෙවන
ගැමියෝ වෙසක්, පොසොන් (අප්‍රේල්, මැයි,
ජූනි) මාසවල දී මෙම නාටකය රඟ දැක්වූහ.
එහි
දී හාස්‍ය රසයෙන් පිරි සොකරි නර්තනයක් රඟ
දැක්වීමෙන් හා නැරඹීමෙන් ගැමියෝ මහත් වූ
ආස්වාදයක් ලැබූ හ. ඒ අනුව, ගැමි සමාජයේ
සාමූහික ව පවත්වනු ලබන සොකරි,
සශ්‍රීකත්වය
සහ විනෝදාස්වාදය අරමුණු කර ගෙන රඟ
දක්වනු ලැබූ බව තහවුරු වේ.



තව ද, ගමට, ප්‍රදේශයට, රටට සිදු වන්නා
වූ නොයෙක් වසංගත රෝග හා ස්වාභාවික
විපත් ආදියෙන් ආරක්ෂා වී, සෙත්
ශාන්තියක් උදා කර ගැනීම ද සොකරි
නාටකය පැවැත්වීමේ
තවත් අරමුණකි.

වර්තමානයේ දී ගැමි නාටක අභාවයට යා
නොදී සංරක්ෂණය කර ගැනීමත්, පාසල්
ශිෂ්‍යයන් ආධ්‍යාපනික අවශ්‍යතා අරමුණු
කරගෙන සොකරි නාටකය රඟ දක්වනු
ලැබේ

# සොකරි නාටකයේ වාදනය

සොකරි නාටකය සඳහා එක් එක් ප්‍රදේශ වශයෙන් වාදන භාණ්ඩ භාවිතයේ දී බොහෝ පළාත්වල උඩරට ගැට බෙරය ද, වන්නි ප්‍රදේශවල උඩැක්කිය ද, ඌව ප්‍රදේශයේ දවුල ද ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගැනෙන අතර, තාලම්පට තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස පොදුවේ යොදා ගැනේ මෙම වාදන භාණ්ඩ එක් ව වාදනය නොකරන අතර, බහුල ව වාදනය කරනුයේ ගැටබෙරය යි. අතීතයේ දී හොරණෑව ද සොකරි නාටකය සඳහා යොදා ගෙන ඇති අතරණී වර්තමානයේ දී හොරණෑ වාදකයකු දක්නට නොමැත.''දොංපිජිගත'' යන බෙර පදය ආරම්භයේ සිට අවසානය තෙක් වැඩි වශයෙන් භාවිත කෙරේ. මීට අමතර ව ශාස්ත්‍රීය වාදනයක් යොදා ගන්නා බවක් දක්නට නැත. කථා වස්තුවරංගදැක්වීම සහ චරිත ප්‍රේක්ෂකයාට හඳුන්වා දීම සඳහා සරල පද හා ගමන් තාල පද වාදනය



# ගායනය

සොකරි නාටකය තුළ ගායනයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. ආරම්භයේ සිට අවසානය තෙක් ම රඟ දක්වන සිද්ධිවල හා චරිතවල ස්වභාවයන් හඳුන්වන්නේ කවි ගායනයෙනි. පොතේ ගුරුන්නාන්සේ ගායනා කරන සෑම පේළියක් ම යළිත් අත්වැල් ගායකයෝ ගයති. මෙහි දී ආරම්භයේ දී හා අතරමැද දී අනාඝාතාත්මක ව කවි යොදා ගනු ලැබේ.

පෙර සම්මතේ දී - වනං දහ අට බේදී
දේශ දහ අට සෑදි - කසි දේශේ නමින් සුසැදි

# ගායනය

සොකරි ගායනාවල දී ගුරුහාමි පිළිබඳ වත්, ඔහුට පරයා සහ සොකරිය හමු වූ ආකාරය පිළිබඳ වත්, ලංකාවට පැමිණීමට තීරණය කර ගන්නා අවස්ථාව දක්වාත් කෙටි හැඳින්වීමක් කවි මඟින් ඉදිරිපත් කෙරේ. එසේ ම, සත් මුහුදු තරණය කොට ලංකාවට ගොඩ බැසීම පිළිබඳ ව ද ගායනය කරනු ලැබේ.

තුන් මස් තුන් පෝයක් ගත වන්නේ
මහ ජල මුහුදේ නැව පොඩි වන්නේ
ඉතින් මෙ අපි කොහොම ද ගැලවෙන්නේ
රුහුණු රටට ගොඩ බසිමු කියන්නේ

# ගායනය

සොකරී නාටකයේ චරිත රංගබිමට ආරාධනා කිරීම සඳහා කවි යොදා ගන්නා අතර,චරිත ස්වභාවය පිළිබඳ හඳුන්වා දීමට ද ගායනා යොදා ගැනේ. එහි දී සොකරිගේ චරිතයපිළිබඳ මෙලෙස විස්තර කෙරේ.

අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නී කොණ්ඩය ගොතා හෙළන්නී
තෝඩු දමන්නී පවලම් මාල බඳින්නී
සේල අඳින්නී පටකින් ඔමරි කරන්නී

## රංග වස්ත්‍රාභරණ සහ රංග භාණ්ඩ භාවිතය

ගුරුහාමි වෙස් ගැන්වීම උඩරට වෙස් නැට්ටුවෙකුගේ ඇඳුම ඇසුරින් නිර්මාණය කර ඇත. එහි පහළ කොටස උඩරට වෙස් නර්තන ශිල්පියකුගේ ඇඳුම් කට්ටලයට බෙහෙවින් සමාන ය.

එනම් හැගලට සමාන ය. ඇතැම් අවස්ථාවල දී ගුරුහාමි ලෙස පෙනී සිටින චරිතය ඉණට පච්චවඩමක් සහ පයට සිලම්බු පලඳී. හිසට මුණ්ඩාසනය පලඳිනුයේ තුන් පැත්තකට තරු තුනක් සිටින සේ ය. දෑතේ දෙපයේ සහ පපුවේ මෙන් ම නළලේ ද සුදු පාටින් ඉරි ඇඳ ඇති

වමත සුරත නළලේ අළු ගාගෙන
දෑත් දෙබැම තේ සෝරු ද ගාගෙන
සිරිත ලෙසට ගඩු ගුඩාව ඇරගෙන
ගනිති නිමිති පොත අතකට ඇරගෙන



# සොකරි

සොකරිය උඩරට සාම්ප්‍රදායික කාන්තාවකගේ ස්වරූපයට සමාන වන සේ ඔසොරියකින් හැඩගන්වා ඇති අතර, අතට සහ පයටසිහින් ගෙජ්ජි ද, කරට ඇට මාල ද, කනට කරාබු ද,අතට වීදුරු වළලු ද පලඳා ඇත. සොකරි නාටකයේගැහැනු චරිත පිරිමින් රඟපාන බැවින් බොරුකොණ්ඩයක් පලඳී. කොණ්ඩය මල් වැලකින්සරසයි. නළල් පටියක් ද පලඳින අතර, අතෙහිමල් පොකුරක් ද ඇත. ඇතැම් ප්‍රදේශවල මල්පොකුර වෙනුවට ලේන්සුවක් භාවිත කරයි..

## පරයා

පරයා කොට කලිසමක් හා කමිසයක් අඳින අතර, එය තරමක් ඉරුණු ස්වරූපයක් පෙන්වයි. කොළපතකින් සාදන ලද වෙස් මුහුණක් පලඳී. හිසට කේතුවක ආකාරයට හිස් වැස්මක් ද පැලඳ සිටී. ඇතැමෙක් එය කොළපතකින් සකසා ගොප්කොළ යොදා අලංකාර කර ගනිති අතේ දිග සැරයටියක් ද රෙදිවලින් මැසූ මල්ලක් ද වෙයි.





## වෙදරාල

කොණ්ඩය පිටුපසට බැඳ සිටින අතර, කණ්ණාඩියක් සහ දිගු රැවුලක් පැලඳ සිටී. කුදුබව පෙන්වීමට පිටට කොට්ටයක් බැඳ ඇත. එමෙන් ම බඩ ඉදිරියට නෙරා ඇති බව පෙන්වීමටකොට්ටයක් ද බැඳ ඇත. මේස් බැනියමක් ඇඳ ඊට උඩින් කෝට් කබායක් ද, සරමක් ද ඇඳඉණට පටියක් ද බඳී. අතට සැරයටියක් ගෙන නටයි





සොත්තානා

වෙදරාලගේ පුතා ලෙස
හඳුන්වන සොත්තානා කුඩා
දරුවකු මෙන් සරසා ඇත.
කොට කලිසමක් සහ බැනියමක්
ඇඳ සිටී. කොළපතකින් සකස්
කළ වෙස් මුහුණ කුඩා
දරුවකුගේ ස්වභාවය ප්‍රදර්ශනය
කරයි. සූප්පුවක් කරේ එල්ලා
ඇති අතර බොහෝ
අවස්ථාවන්හි
වෙස් මුහුණෙහි කටට සූප්පුව
තබා ගෙන නර්තනය ඉදිරිපත්
කරයි.

# සොකරි නාටකයේ චරිත නිරෑපණය පිළිබඳ විචාරය

සොකරි නාටකයේ ආඩිගුරු හෙවත් ගුරුහාමි, සොකරි, පරයා, වෙදරාල යන චරිතප්‍රධාන චරිතය. මෙම චරිතවල ස්වභාවය එකිනෙකට වෙනස් වේ. චරිත නිරෑපණය කිරීමේදී ඔවුන්ට ආවේණික වූ ගමන් තාල, අංග ලක්ෂණ, බෙර පද, කවි ගායනා, නර්තන විධි ඉදිරිපත්කරනු ලැබේ..



# ගුරුහාමි

ගුරුහාමි යනු ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයෙන් පැමිණි තැනැත්තකු ලෙස හැඳින්වේ.මොහු තරමක් වයස්ගත පුද්ගලයෙකි. එම නිසා චරිත නිරූපණය ඊට අනුගත ආකාරයෙන් සිදුකරන අතර, මොහුට සිංහල බස කතා කිරීමට ඇති අපහසුතාවත් දෙබස් මඟින් ඉදිරිපත්කෙරේ. ඔහු සිංහල වචන වැරදි ලෙස උච්චාරණය කිරීම නිසා අකරතැබ්බයන්ට මුහුණ දෙයි.ඒවා හාස්‍යෝත්පාදනය කරන අවස්ථාවන් ලෙස දැක්විය හැකි ය. ගුරුහාමි රඟමඬලට පිවිසීමේ දී කවි ගයන අතර, එම ගායනවලට අනුව නටයි. එමඟින් ඔහු නැටුම් ශිල්පය ප්‍රගුණ කළ පුද්ගලයකු බව විදහා දක්වයි. ඔහු නටනුයේ උඩරට නැටුම් බව පැහැදිලි ය. ගුරුහාමිගේ චරිතය සඳහා ද ‘‘දොංපී පීගත’’ බෙර පදය වාදනය කරයි. එම බෙර පදයට සහ කවියට අනුව නටමින් රඟමඬල වටේට ගමන් කරයි...

## ගුරුහාමි

දේසේ සිට ආ එගුරු මහල්ලා
දියට යන්ට ලබු ගෙඩියක් එල්ලා
තඹරාවිට වෙදරාලගේ බල්ලා
ගුරුවගෙ කකුලක් කාපි බොලල්ලා

# සොකරිය

සොකරි නාටකය තුළ රඟ දක්වන ප්‍රධාන ම කාන්තා චරිතය වන මැය, ඉතා රූමත් තරුණියකි. ඇයගේ ගමන කලාත්මක ය, ලයාන්විත ය, ශෘංගාරාත්මක රසයක් මතු වන ආකාරයෙන් බෙර පදයට සහ ගායනයන්ට අනුව අංග චලන දක්වමින් ගමනෙහි යෙදේ. එසේ ම සොකරිය නාටකය තුළ දී කතා නොකරන බැවින් බොහෝවිට බිම බලා ගෙන ඇස්වලින් ඉඟිබිඟි පාමින් රංගනයේ යෙදීම එම චරිතයේ සුවිශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැකි ය. මැය ලජ්ජාශීලී ස්ත්‍රියක ලෙස රංගනයේ යෙදේ. සොකරි සඳහා ද ‘‘දොංජි ජිගත’’ බෙර පදය වාදනය කරන අතර, ඇය රංගනයට ප්‍රවිෂ්ට වීමේ දි මෙවැනි ගායනාවන් සිදු කරයි.



සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පදු අල්ලන්නී පියයුරු ළැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මූණ බලන්නී

# පරයා

සොකරිගේ සහ ආඬිගුරුගේ අතවැසියා වන පරයා, මුඛරි බසින් යුක්ත ය. ගුරුහාමිත්,ප්‍රේක්ෂකයාත් සම්බන්ධ කිරීමට අතරමැදි වන චරිතය ලෙස පරයා හැඳින්විය හැකි ය. මොහු විකට ස්වරූපයකින් යුක්ත වන අතර, ප්‍රේක්ෂකයාට හාස්‍ය රසයක් ලබා දෙමින් බෙර පදයට සහ ගායනයට අනුව වට්ටේට නටයි. වරින් වර සොකරිය දෙස ගිජු බැලුම් හෙළයි. පරයාගේ නැටුම් පිළිවෙළකට නොකෙරෙන අතර, බෙර තාලයට අනුව උඩ පනිමින් අතපය විසි කරමින්හාස්‍යෝත්පාදනය වන අයුරින් චරිතය නිරූපණය කරයි.

# පරයා

ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ
පරයා එන්නේ වටපිට නිතර බලන්නේ
කට දොඩවන්නේ ගිය ගිය තැන පෙරළෙන්නේ
කොක් හඬලන්නේ සොකරිය දෙසයි බලන්නේ



පරයාගේ චරිත නිරූපණය කිරීමේ දී සිංහල බස උච්චාරණය කිරීමට ඇති අපහසුතාව පෙන්වමින් චරිතය රඟ දක්වනු ලැබේ.



පොතේ ගුරු : ඉතිං මුන්නැහැ මේ මෙච්චර දුර රටක ඉඳල මොකට ද මෙහාටආවේ.

පරයා : හාවෙද හාවෙ පෝම විශාල සාජකාලියකට

පොතේ ගුරු : මොකක් ද අප්පේ ඔය මහ ලොකු රාජකාරිය?

ගුරු : ඔව් ඔව් මහා ලොකු රාජකාරියක් බව නම් තේරෙනවා කරේ තියෙන මල්ලෙන් ම



පොතේ ගුරු : ඇත්තට ම උන්නැහෙ මොනවද ඔය මල්ලෙ?

පරයා : මී කෙද? මී කෙද මීකේ ආල්තිල්ලර

පොතේ ගුරු : මොනවලු

ගුරු : ආල්තිල්ලරලු. මං හිතන්නෙ හාල් සිල්ලර වෙන්න ඇති

පොතේ ගුරු : ඉතිං අපි අහපු එකට තාම උත්තර ලැබුණෝ නෑනේ.

ගුරු : ඒක තමයි මොකක් ද ඔය ලොකු රාජකාරිය

# වෙදරාල

මොහු වයස්ගත පුද්ගලයකු වුව ද ස්ත්‍රී ලෝලියකු ලෙස චරිත නිරූපණය වෙයි. සොකරිය ගුරුහාමිට බෙහෙත් කිරීමට නිවසට ගොස් වෙදරාල කැඳවා ගෙන එන අවස්ථාවේ දී වෙදරාල සොකරිය පිළිබඳ දක්වන කෑදරකමත්, ඔහුගේ සල්ලාලකමත් ප්‍රේක්ෂකයා සිනා ගන්වමින් ඉදිරියේ දී සිදු විය හැකි දේ පිළිබඳ ව කිසියම් ඉඟියක් ලබා දෙමින් ඔහුගේ චරිතය නිරූපණය වෙයි. විශේෂ අවස්ථාවක් ලෙස සොකරිය නැවත කැඳවා ගෙන ඒමට ගුරුහාමි, වෙද ගෙදරට ගිය අවස්ථාවේ දී ඇති වූ දබරය දැක්වේ. එහි දී වෙදා සොකරියගේ එක අතකින් අදින අතර ගුරුවා අනික් අතින් අදී. මෙම ජවනිකාව ඉතා හාස්‍ය ජනක ය. (වෙදරාල වයෝවෘද්ධ බැවින් හැරමිටි ගසමින් දබර කර ගනියි.) මේ ආකාරයට නිරූපණය වන චරිතයෙන් වෙදරාලගේ මහලු බව හා ස්ත්‍රී ලෝලිත්වය ප්‍රදර්ශනය කෙරෙයි.

වෙදා නටන්නේ සබයේ පැන පැන යන්නේ
යොදා කියන්නේ තාලෙට පද අල්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
වෙදා පාන්නේ අත් දෙක තෑගි කියන්නේ.



# ගැමි නාටක සංරක්ෂණය කර ගැනීම සඳහා යෝජනා

සෑම වර්ෂයකට ම වරක් වත් පාසල් සිසුනට සහ
මහජනතාවට  රස විදීම සඳහා එම ගැමි නාටක රඟ
දක්වමින් සන්දර්ශන පැවැත්වීම

ගැමි නාටක කලාව පිළිබඳ ව ග්‍රන්ථ රචනා කිරීම්
ගැමි නාටක රඟ දක්වන අවස්ථා රූ ගත කොට ශ්‍රව්‍ය ධාහය
පට සම්පාදනය
කිරීම

# ගැමි නාටක සංරක්ෂණය කර ගැනීම සඳහා යෝජනා

ගැමි නාටකවල ඇති වටිනාකම් අගයමින් පුවත්පත් සඳහා ලිපි සකස් කිරීම

රූපවාහිනිය, ගුවන් විදුලිය වැනි ජනමාධ්‍ය මඟින් සිංහල ගැමි නාටක කලාවපිළිබඳ වැඩසටහන් නිර්මාණය කර විකාශනය කිරීම.

# කාර්ය පත්‍රිකාව

1. සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු 2ක් නම් කරන්නි

2. සොකරි ගැමි නාටකය හුදු විනෝදාස්වාදය සඳහා ම පවත්වන්නක් ද? එසේ නොමැති නම් ඊට කරුණු දක්වන්නි

3. සොකරිය ඇතුළු පිරිස ලංකාවට පැමිණීමට හේතු දක්වන්නි

4. සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ නම් කර, එම ප්‍රදේශවල භාවිත කරන වාද්‍ය භාණ්ඩ නම් කරන්න.

## කාර්ය පත්‍රිකාව

5. සොකරි නාටකයේ රඟ දක්වන චරිත ස්වභාව විස්තර කිරීම සඳහා ගායනා ඉවහල් වී ඇති බව සනාථ කරන්නි

6. වෙස් ගැන්වීමේ දී ගුරුහාමි ද්‍රවිඩ පුද්ගලයකු බව පෙන්වීමට යොදා ගෙන ඇති උපක්‍රම මොනවා ද?


7. සොකරි නාටකය රඟ දැක්වීමේ දී භාවිත කරන රංග භාණ්ඩ මොනවා ද?

8. පරයාගේ චරිතය පිළිබඳ අදහස් දක්වන්න.

9. පහත සඳහන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

# කාර්ය පත්‍රිකාව

## 9. පහත සඳහන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



## හරහට :

1. උඩරට ගැමි නාටකයට අයත් ප්‍රධාන චරිතයකි

2. සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයකි

3. සොකරි නාටකය සඳහා යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩයකි

4. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස දවුල යොදා ගන්නා පළාතකි

5. සොකරි ගැමි නාටකය අයත් වන සම්ප්‍රදායය මේ නමින් හැඳින්වේ

6. සොකරියගේ මෙහෙකාරිය හඳුන්වන නමකි

7. කවි ගායනාවේ සඳහන් පරිදි සොකරි සැරසී සිටින වස්ත්‍ර මෙනමින් හැඳින්වේ.

පහළට :

1. වෙදරාලගේ පුතා මෙනමින් හැඳින්වේ.

6. ගුරුහාමි ලක්දිවට පැමිණීමට පෙර වාසය කළ ප්‍රදේශය යි.

8. සොකරි ගැමි නාටක සඳහා භාවිත වන වාද්‍ය භාණ්ඩය යි.

9. සොකරිය කරට පලඳින ආභරණයකි.

## හරහට :

## 1. උඩරට ගැමි නාටකයට අයත් ප්‍රධාන චරිතයකි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 | න් | |
| ත් | | | | 8 | | | |
| 3 | | | | ට | | 6 | |
| | | | | | | | |
| | | 5 | | ර | | | 9 |
| 4 | | | | | | 7 සෝ | |


## හරහට :

## 2. සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයකි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | ■ | ■ | 2 ව | න් | නි |
| ත් | ■ | ■ | ■ | 8 | ■ | ■ | ■ |
| 3 | | | | ට | ■ | 6 | |
| | ■ | ■ | ■ | | ■ | | ■ |
| ■ | ■ | 5 | | ර | | ■ | 9 |
| 4 | | ■ | ■ | | ■ | 7 සෝ | |

## හරහට :

## 3. සොකරි නාටකය සඳහා යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩයකි



## හරහට :

## 4. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස දවුල යොදා ගන්නා පළාතකි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 ව | න් | නි |
| ත් | | | | 8 | | | |
| 3 තා | ල | ම් | පො | ට | | 6 | |
| | | | | | | | |
| | | 5 | | ර | | | 9 |
| 4 උඩ | ව | | | | | 7 සෝ | |

හරහට :5. සොකරි ගැමි නාටකය අයත් වන සම්ප්‍රදායය මේ නමින් හැඳින්වේ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 ව | න් | නි |
| ත් | | | | 8 | | | |
| 3 තා | ල | ම් | පො | ට | | 6 | |
| | | | | | | | |
| | | 5 උ | ඩ | ර | ට | | 9 |
| 4 ඌ | ව | | | | | 7 සෝ | |

## හරහට :

## 6. සොකරියගේ මෙහෙකාරිය හඳුන්වන නමකි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 ව | න් | නි |
| ත් | | | | 8 | | | |
| 3 තා | ල | ම් | පො | ට | | 6 කා | ලි |
| | | | | | | | |
| | | 5 උ | ඩ | ර | ට | | 9 |
| 4 ඌ | ව | | | | | 7 සෝ | |

# හරහට :

## 7. කවි ගායනාවේ සඳහන් පරිදි සොකරි සැරසී සිටින වස්ත්‍ර මෙනමින් හැඳින්වේ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | ■ | ■ | 2 ව | න් | නි |
| ත් | ■ | ■ | ■ | 8 | ■ | ■ | ■ |
| 3 කා | ල | මි | පො | ට | ■ | 6 කා | ලි |
| | ■ | ■ | ■ | | ■ | | ■ |
| ■ | ■ | 5 උ | ඩ | ර | ට | ■ | 9 |
| 4 ඌ | ව | ■ | ■ | | ■ | 7 සේ | ල |

## පහළට :

1. වෙදරාලගේ පුතා මෙනමින් හැඳින්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 ව | න් | නි |
| ත් | | | | 8 | | | |
| 3 තා | ල | ම් | පො | ට | | 6 කා | ලි |
| නා | | | | | | | |
| | | 5 උ | ඩ | ර | ට | | 9 |
| 4 ඌ | ව | | | | | 7 සේ | ල |

පහළට :

6. ගුරුහාමි ලක්දිවට පැමිණීමට පෙර වාසය කළ ප්‍රදේශය යි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 ව | න් | නි |
| ත් | | | | 8 | | | |
| 3 තා | ල | ම් | පො | ට | | 6 කා | ලි |
| නා | | | | | | සි | |
| | | 5 උ | ඩ | ර | ට | | 9 |
| 4 ඌ | ව | | | | | 7 සෝ | ල |

පහළට :

8. සොකරි ගැමි නාටක සඳහා භාවිත වන වාද්‍ය භාණ්ඩය යි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 ව | න් | නි |
| ත් | | | | 8 ගැ | | | |
| 3 තා | ල | ම් | පො | ට | | 6 කා | ලි |
| නා | | | | බෙ | | සි | |
| | | 5 උ | ඩ | ර | ට | | 9 |
| 4 ඌ | ව | | | ය | | 7 සෝ | ල |

## පහළට :

9. සොකරිය කරට පලඳින ආභරණයකි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සො | ක | රි | | | 2 ව | න් | නි |
| ත් | | | | 8 ගැ | | | |
| 3 තා | ල | ම් | පො | ට | | 6 කා | ලි |
| නා | | | | බෙ | | සි | |
| | | 5 උ | ඩ | ර | ට | | 9 මා |
| 4 ඌ | ව | | | ය | | 7 සෝ | ල |



# ආයුබෝවන්